# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදයම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 ජනවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 56/72.

**වියපැහැදම් කළ හැකි ආදායමට උපරිමයක් නියම කිරීම පිණිස ද අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදලක් පිහිටුවීම පිණිස ද ආදායම මත ගණන් බලන මුදලක් අනිවාර්ය දායක මුදල් වශයෙන් ඒ අරමුදලට ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස හා ඉහත කී කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1072 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## පනත අදාළ වීම

2. (1) මේ පනත මෙහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව— පනත අදාළවීම.

(අ) සෑම පවුලක ප්‍රධානයකු හා පවුලකට ඇතුළත් නැති සෑම පුද්ගලයකු කෙරෙහි ද;

(ආ) භාරය යටතේ හිමිකම් ඇති අර්ථලාභීන්ගේ කොටස් යම් වර්ෂයක දී නිශ්චිතව දැන ගත නොහැකි විට යම් භාරයක භාරකරු කෙරෙහි ද;

(ඇ) මිය ගිය තැනැත්තාගේ උරුමකරුවන්ට හිමිකම් ඇති කොටස් නිශ්චිතව දැන ගත නොහැකි නම් යම් මියගිය තැනැත්තකුගේ බූදලයේ බූදල් බලකරු කෙරෙහි ද;

(ඈ) සෑම නො බෙදුණු හින්දු පවුලක් කෙරෙහි; හා

(ඉ) නිශ්චිතව සඳහන් සෑම සමාගමක් කෙරෙහි ද

අදාළ විය යුතු ය.

(2) මේ පනත—

(අ) අන් කිසි රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි සිටින (කවර නාමයකින්, අභිධානයකින් හෝ පදවි නාමයකින් වුව ද හැඳින් වෙන) රාජ දූත නියෝජිතයකු කෙරෙහි ද;

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් රාජ දූත නියෝජිතයකු විසින් නියෝජනය කරනු ලබන රටේ පුර වැසියකු හෝ යටත් වැසියකු වන ඒ රාජ දූත නියෝජිත

I—ජෝ 17355—12,308 (72/10)

යාගේ කාර්ය මණ්ඩලයෙහි යම් සාමාජිකයකු, තමා විසින් නියෝජනය කරනු ලබන රටේ පුරවැසියකු හෝ යටත් වැසියකු වන යම් කොන්සල්වරයකු හෝ වෙළෙඳ කොම සාරිස්වරයකු සහ ඒ කොන්සල්වරයා හෝ වෙළෙඳ කොමසාරිස්වරයා විසින් නියෝජනය කරනු ලබන රටේ පුරවැසියකු හෝ යටත් වැසියකු වන ඒ කොන්සල්වර යාගේ හෝ වෙළෙඳ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩල යෙහි යම් සාමාජිකයකු කෙරෙහි ද;

(ඈ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් වැටුප් හෝ මූලික පඩිනඩි ගෙවනු නො ලබන්නා වූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂඥ නියෝජ්‍යත්වයක් මාර්ගයෙන් හෝ අමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුවේ සිවි වැඩදැරුම් ආධාර ක්‍රමය යටතේ හෝ කොළඹ ක්‍රම සංවිධානය මාර්ගයෙන් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ඒ හා සමාන යම් සංවිධානයක් මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබුවා වූ ද යම් විශේෂඥයකු, උප දේශකයකු, කාර්මික ශිල්පියකු හෝ නිලධරයකු කෙරෙහි ද;

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා එහි විශේෂඥ නියෝජ්‍යත්වවල හෝ කොළඹ ක්‍රම සංවිධානයේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ඒ සමාන යම් සංවිධානයක හෝ යම් කාර්මික සහයෝගතා වැඩ පිළිවෙළක් යටතේ විදේශයකින් ශ්‍රී ලංකාවට එවනු ලැබූ යම් අභ්‍යාස ලාභියකු කෙරෙහි ද;

(ඉ) ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින්නා වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නො වූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් නිලධරයකු කෙරෙහි ද;

(ඊ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ඉල්ලීම පිට හෝ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකාවෙහි සිටින ශ්‍රී ලංකාව නො වන රටක නාවික හමුදාවේ, යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් සාමාජික යකු කෙරෙහි ද;

(උ) පුණ්‍යාධාර කාර්යයක් සඳහා පමණක් පිහිටුවනු ලැබූ හෝ පුණ්‍යාධාර කාර්යයක් කර ගෙන යාමෙහි ලා පමණක් යෙදෙන භාරයක භාරකරුවකු කෙරෙහි ද

අදාළ නො විය යුතු ය.

මේ පනතේ කාර්යය සඳහා පවුල යන්නෙහි අර්ථය.

3. (1) යම් තක්සේරු වර්ෂයක් තුළ නේවාසික පුද්ගලයකුට භාර්යාවක සිටින්නා වූ හා කිසිම දරුවකු හෝ යැපෙන ඥාතියකු නො සිටින්නා වූ හෝ භාර්යාවක හා යම් දරුවකු හෝ යැපෙන ඥාතියකු සිටින්නා වූ හෝ යම් දරුවකු හෝ යැපෙන ඥාතියකු සිටින්නා වූ අවස්ථාවක ඔවුන් පවුලක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පුද්ගලයා ඒ පවුලේ ප්‍රධානයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ නිර්වාසික පුද්ගලයකුට භාර්යාවක සිටින අවස්ථාවක ඔවුන් පවුලක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පුද්ගලයා ඒ පවුලේ ප්‍රධානයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

## II වන කොටස

## අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල පිහිටුවීම.

4. (මේ පනතෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල යනුවෙන් හැඳින්විය යුතු අරමුදලක් මේ පනතේ කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

අරමුදලේ පරිපාලනය.

5. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට අරමුදලේ සාමාන්‍ය පරිපාලනය භාර විය යුතු අතර අරමුදලේ මුදල් එම මණ්ඩලය භාරයේ තිබිය යුතු ය.

අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදලෙන් කළ යුතු ගෙවීම.

6. අරමුදල පරිපාලනයෙහි ලා දරනු ලබන වියදම් ගෙවීම ද අරමුදලට ගෙවනු ලබන දායක මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල් ගෙවීම ද අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් ආපසු ගෙවීම ද අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වලට අතිරික්තව ගෙවන ලද මුදල් ආපසු ගෙවීම ද අරමුදලින් කළ යුතු ය:

එසේ වුව ද එකී යම් ගෙවීමක් කිරීමට අරමුදලේ මුදල් ප්‍රමාණවත් නොවන කවර විටෙක වුව ද ඒ ඌනතාව ඒකාබද්ධ අරමුදලෙන් පියවිය යුතු ය.

අරමුදලේ මුදල් ආණ්ඩුවට ණයට දිය යුතු බව.

7. (1) අන් කිසි ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද ශ්‍රී ලංකා මහා බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමයන් පිට අරමුදලේ මුදල් ආණ්ඩුවට ණයට දිය යුතු ය.

(2) ආණ්ඩුවට දෙන ලද ණය වෙනුවෙන් පොලී වශයෙන ලබන යම් මුදලක් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

## III වන කොටස

### දායක මුදල්

දායක මුදල්.

8. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, 1972 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක්ම සඳහා,—

(අ) මේ පනත අදාළ වන (නිශ්චිතව සඳහන් සමාගමක් නොවන) සෑම තැනැත්තකුම විසින්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ සේවා නියුක්තියෙන් ලබන ආදායම හා ඒ තක්සේරු වර්ෂයට කලින් වූ වර්ෂය සඳහා හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තිය නො වන අන් මාර්ගවලින් ලබන ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම ප්‍රධාන පනතේ 12 වන වගන්තිය යටතේ අන් කිසි කාලපරිච්ඡේදයක් අනුව ගණන් බලනු ලබන්නේ නම් ඒ අනික් කාලපරිච්ඡේදයක් සඳහා හෝ ලබන ආදායම වෙනුවෙන් 11 වන වගන්තියේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලබන මේ පනතෙහි මින් මතු "සාමාන්‍ය දායක මුදල" යනුවෙන් සඳහන් කෙරෙන දායක මුදලක් ද මේ පනතින් නියම් වේ නම් 13 වන වගන්තියේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලබන විශේෂ දායක මුදලක් ද කොමසාරිස්වරයා මාර්ගයෙන් අරමුදලට ගෙවිය යුතු ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක ලාභවලට හෝ ආදායමට 1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හෝ මේ පනත හෝ යටතේ දායක මුදලක් ගෙවා ඇති යම් කාලපරිච්ඡේදයක් සඳහා යම් මාර්ගයකින් ලැබුණු ලාභ හෝ ආදායම ඇතුළත් වන අවස්ථාවක, මේ ඡේදයේ මෙයට පෙර වූ විධිවිධාන අනුව ගණන් බලා දැන ගන්නා ලාභ හෝ ආදායම හා ඒ පළමුව සඳහන් කළ කාල පරිච්ඡේදය අවසන් වන දිනයට ඉක්බිතිව ම වූ දිනයෙහි ආරම්භ වන දොළොස් මාසයක කාලපරිච්ඡේදය සඳහා ලැබුණු ලාභ හෝ ආදායම යන මේ දෙකින් අඩු කුමක් ද එය ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ මාර්ගයෙන් ලැබුණු ලාභ හෝ ආදායම විය යුතු ය. තව ද

(ආ) සෑම නිශ්චිතව සඳහන් සමාගමක් ම විසින්, එම තක්සේරු වර්ෂයට කලින් වූ වර්ෂය සඳහා හෝ එම තක්සේරු වර්ෂයට කලින් වූ වර්ෂය ඇතුළත වූ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් දිනයක අවසන් වන

දොළොස් මාසයක යම් කාලපරිච්ඡේදයක් සඳහා වූ ඒ සමාගමේ විශේෂ ආදායම වෙනුවෙන් 11 වන වගන්තියේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලබන දායක මුදලක් කොමසාරිස්වරයා මාර්ගයෙන් අරමුදලට ගෙවිය යුතු ය.

9. (1)(2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත අදාළ වන (නිශ්චිතව සඳහන් සමාගමක් නොවන) යම් තැනැත්තකු විසින් 8 වන වගන්තියෙහි සඳහන් දායක මුදල් ගෙවිය යුතු වන්නේ යම් ලාභයක් හා ආදායමක් වෙනුවෙන් ද, ඒ ලාභ හා ආදායම, ප්‍රධාන පනතේ විධිවිධාන අනුව ගණන් බලා එම පනත යටතේ ආදායම් බදු ගෙවිය යුත්තේ යම් "ලාභයක් හා ආදායමක්" හෝ "ලාභයක්" හෝ "ආදායමක්" වෙනුවෙන් ද ඒ "ලාභ හා ආදායම" හෝ "ලාභ" හෝ "ආදායම" හෝ විය යුතු ය.

දායක මුදල් ගෙවීමට යටත් ආදායම.

(2) (අ) නිශ්චිතව සඳහන් සමාගමක් නො වන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ දායක මුදල් ගෙවිය යුතු වන්නේ යම් ලාභයක් හෝ ආදායමක් වෙනුවෙන් ද ඒ ලාභවලට හා ආදායමට—

(i) ප්‍රධාන පනතේ අර්ථානුකූල වූ අණ්ඩුවේ ආයතනයක් විසින් තොරතුරු සපයන්නන්ට තෑගි ගෙවීමේ යම් යෝජනා ක්‍රමයක් යටතේ තෑග්ගක් වශයෙන් එකී තැනැත්තාට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජික යකුට ලැබුණු යම් මුදලක් ද,

(ii) අඩු කර ගත නොහැකි වැටුප් අත්තිකාරමක් වශයෙන් හෝ තක්සේරුකරුගේ මතය අනුව ආපසු ගෙවීම පිණිස වූ කිසියම් සතුටුදායක ක්‍රමයක් නොමැති වැටුප් අත්තිකාරමක් වශයෙන් හෝ එකී තැනැත්තාට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජික යකුට ලැබුණු යම් මුදලක් ද,

(iii) එකී තැනැත්තා හෝ ඔහුගේ පවුලේ යම් සාමාජික යකු සමාගම් ආඥාපනතේ අර්ථානුකූල වූ පුද්ගලික සමාගමක් හෝ ප්‍රධාන පනතේ 70 වන වගන්තියේ අර්ථානුකූල වූ "තැනැත්තන් පස් දෙනකුට නොවැඩි ගණනක් විසින් පාලනය කරනු ලබන සමාගමක්" වන යම් සමාගමක අධ්‍යක්ෂවරයකු නම් හෝ එම සමාගමෙන් ණය මුදලක් වශයෙන් යම් තක්සේරු වර්ෂයක් තුළ ඔහුට හෝ ඔහුගේ පවුලේ ඒ සාමාජිකයාට ලැබුණු ශුද්ධ මුදල ද

ඇතුළත් විය යුතු ය.

(ආ) නිශ්චිතව සඳහන් සමාගමක් නො වන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ දායක මුදල් ගෙවිය යුතු වන්නේ යම් ලාභයක් හෝ ආදායමක් වෙනුවෙන් ද ඒ ලාභවලට හා ආදායමට—

(i) දිනුම් ඇදීමක දී හෝ ලොතරැයියක දී ඔහු විසින් හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු විසින් දිනා ගන්නා ලද තෑග්ගක වටිනාකම;

(ii) ඔහුට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට දෙනු ලැබූ යම් තෑග්ගක් හෝ පරිත්‍යාගයක් ;

(iii) ශ්‍රී ලංකාවෙහි දී කරන ලද අතීත සේවය සඳහා එම තැනැත්තා හෝ ඔහුගේ භාර්යාව ශ්‍රී ලංකාවෙහි නේවාසිකව නැති විට නිර්වාසික තැනැත්තා ලබන විශ්‍රාම වැටුප ;

(iv) විශ්‍රාම වැටුප් පරිවර්තනයෙහි දී ඔහු හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු ලැබූ යම් මුදලක් ;

(v) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනතේ 46 (1) වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ හෝ පළාත් පාලන සේවය සඳහා පිහිටුවන ලද යම් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයට අදාළ එකී 46(1) වන වගන්තියට හෝ 49 වන වගන්තියට අනුරූප යම් නියෝගයක් යටතේ හෝ ඔහුට ආපසු ගෙවනු ලැබූ යම් මුදලක් ;

(vi) විශ්‍රාම පාරිතෝෂිකයක් වශයෙන් ඔහුට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට ලැබුණු මුදලක් ;

(vii) කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලකින් හෝ ප්‍රධාන පනතේ අර්ථානුකූල වූ පරිපාලිත යම් අර්ථසාධක අරමුදලකින් ඔහුට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට යම් සේවා නියුක්තියකින් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ගෙවනු ලැබූ මුදලක් ;

(viii) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදලින් ඒ පනත යටතේ ප්‍රතිලාභයක් වශයෙන් ගෙවනු ලැබූ යම් මුදලක් ;

(ix) ප්‍රාග්ධන ලාභ ; හා

(x) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ලාභ හා ආදායම් පන්තියකට හෝ වර්ගයකට අයත් යම් ලාභ හා ආදායම

යන මේවා ඇතුළත් නො විය යුතු ය.

මේ ඡේදය යටතේ කරනු ලබන සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියමයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතු ය. යම් නියමයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

(3) නිශ්චිතව සඳහන් සමාගමක් විසින් 8 වන වගන්තියෙහි සඳහන් දායක මුදල් ගෙවිය යුතු විශේෂ ආදායම් ප්‍රධාන පනතේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ii) වන ඡේදය හෝ (iii) වන ඡේදය හෝ (iv) වන ඡේදය හෝ (vii) වන ඡේදය හෝ යටතේ ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් යම් ව්‍යාපාරයකින් ඒ සමාගමට ලැබෙන ලාභ හා ආදායම විය යුතු අතර ඒ විශේෂ ආදායම ප්‍රධාන පනතේ කාර්යයන් සඳහා ලාභ හා ආදායම ගණන් බලනු ලබන ආකාරයට ම ගණන් බලා දැන ගත යුතු ය.

(4) යම් තැනැත්තකු සියලුම මාර්ගවලින් තමාට ලැබෙන මුළු ආදායම මත 8 වන වගන්තියෙහි සඳහන් දායක මුදල් ගෙවිය යුතු අතර ප්‍රධාන පනතේ කාර්යයන් සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කර ගන්නා ආකාරයට ම හා ඒ මූලධර්ම ම අනුව ඒ මුළු ආදායම ගණන් බැලිය යුතු ය.

(5) මේ පනතේ කාර්යයන් සඳහා—

(අ) පවුලක ප්‍රධානයා වූ නේවාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වූ විට (ඒ පුද්ගලයාගේ මුළු ආදායම හා එම පවුලට ඇතුළත් යම් දරුවකුගේ මුළු ආදායමෙන් නියුක්තියෙන් ලැබෙන ආදායම වන කොටස නො වන) ඒ පවුලේ සාමාජිකයන්ගේ මුළු ආදායම්, ප්‍රධාන පනතේ කාර්යයන් සඳහා ඒ පවුලේ සාමාජිකයන්ගේ තක්සේරු කළ හැකි ආදායම එකට එකතු කරනු ලබන ආකාරයට ම හා ඒ ප්‍රමාණයට ම එකට එකතු කරනු ලැබිය යුතු අතර යම් තක්සේරු වර්ෂයක් සඳහා එසේ එකතු කරනු ලැබූ මුළු ආදායම ඒ පුද්ගලයාගේ මුළු ආදායමේ කොටසක් වන ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද

(ආ) පවුලක ප්‍රධානයා වූ නිර්වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වූ විට ඔහුගේ භාර්යාවගේ මුළු ආදායම ඒ පුද්ගලයාගේ මුළු ආදායමේ කොටසක් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් දායක මුදල් ගෙවිය යුතු වන ආදායම ගණන් බැලීමේ දී අවස්ථාවෝචිත පරිදි ඔහුගේ මුළු ආදායමෙන් නැතහොත් ඔහුගේ විශේෂ ආදායමෙන්—

(අ) ඔහුගේ බදු ගෙවිය යුතු ආදායම ගණන් බැලීමේ දී ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ප්‍රධාන පනත යටතේ අඩු කිරීමට ඔහුට හිමිකම් තිබෙන දීමනා ද,

(ආ) අමාත්‍යවරයා විසින් මේ ඡේදය යටතේ කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යම් නියමයක විධිවිධාන යටතේ අඩු කිරීමට ඔහුට හිමිකම් තිබෙන දීමනා ද

අඩු කිරීමට ඔහුට හිමිකම් තිබිය යුතු අතර ඒ දීමනා එසේ ඉන් අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුළු ආදායම මේ පනතෙහි මින් මතු "දායක මුදල් ගෙවිය යුතු ආදායම" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ආ) ඡේදය යටතේ කරනු ලබන සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතු ය. යම් නියමයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ දායක මුදල් ගෙවීමට යටත් වීමෙන් ඇතැම් පුද්ගලයන් නිදහස් කිරීම.

**10.** පවුලක ප්‍රධානයා වූ හෝ පවුලට ඇතුළත් නැති පුද්ගලයකු—

(අ) දායක මුදල් ගෙවිය යුතු ඔහුගේ ආදායමට සමාන බදු අය කළ හැකි ආදායමක් වෙනුවෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා ප්‍රධාන පනත යටතේ ගෙවීමට යටත් වන ආදායම් බද්ද රුපියල් අටසිය හතලිහකට වැඩි නොවේ නම්; හෝ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මුළු ආදායම රුපියල් දොළොස් දහසකට වැඩි නොවේ නම්

ඒ තක්සේරු වර්ෂය සඳහා මේ පනත යටතේ දායක මුදල් ගෙවීමට ඒ පුද්ගලයාට නියම නො කළ යුතු ය.

සාමාන්‍ය දායක මුදලේ ප්‍රමාණය.

**11.** (1) මේ පනත අදාළ වන (නිශ්චිතව සඳහන් සමාගමක් නො වන) යම් තැනැත්තකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු සාමාන්‍ය දායක මුදල ඔහුගේ දායක මුදල් ගෙවිය යුතු ආදායම ප්‍රධාන පනතේ කාර්යයන් සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායම වූයේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා ප්‍රධාන පනත යටතේ ඔහුට ගෙවීමට සිදුවන ආදායම් බද්දෙන් සියයට හතලිහකට සමාන මුදලක් විය යුතු ය.

(2) නිශ්චිතව සඳහන් සමාගමක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල එම තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ දායක මුදල් ගෙවිය යුතු ආදායමෙන් සියයට පනහකට සමාන මුදලක් විය යුතු ය.

පුද්ගලයන් සම්බන්ධයෙන් ආන්තික සහනය.

**12.** පවුලක ප්‍රධානයා වූ හෝ පවුලකට ඇතුළත් නැති පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු සාමාන්‍ය දායක මුදල—

(අ) එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ මුළු ආදායම එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම වූයේ නම් ඒ ආදායම වෙනුවෙන් ප්‍රධාන පනත යටතේ ගෙවීමට ඔහු යටත් වන ආදායම් බද්ද ඒ ආදායමෙන් අඩු කිරීමෙන් පසුව එන ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මුළු ආදායම, රුපියල් දොළොස් දහස හා ඒ රුපියල් දොළොස් දහස එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම වූයේ නම් එම රුපියල් දොළොස් දහස වෙනුවෙන් ගෙවීමට ඔහු යටත් වන ආදායම් බද්ද හා අතර වෙනසට වැඩි වන්නේ යම් මුදලකින් ද ඒ මුදල, හෝ

(ආ) එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ දායක මුදල් ගෙවිය යුතු ආදායම එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ බදු අය කළ හැකි ආදායම වූයේ නම් ඒ ආදායම වෙනුවෙන් ප්‍රධාන පනත යටතේ ගෙවීමට ඔහු යටත් වන ආදායම් බද්ද ඒ ආදායමෙන් අඩු කිරීමෙන් පසුව එන එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ දායක මුදල් ගෙවිය යුතු ආදායම හා ආදායම් බදු වශයෙන් රුපියල් අටසිය හතලිහක් ගෙවීමට ඔහු යටත් විය හැකි මුදලක් ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායම වූයේ නම් ඒ මුදලෙන් රුපියල් අටසිය හතලිහක් අඩු කිරීමෙන් පසු ඉතිරිවන මුදල හා අතර වෙනස

යන දෙකින් අඩු කුමක් ද ඒ මුදලට වැඩි නො විය යුතු ය.

13. (1) පවුලක ප්‍රධානයා වූ හෝ පවුලකට ඇතුළත් නැති හෝ පුද්ගලයකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ දායක මුදල් ගෙවිය යුතු ආදායම — *වියපැහැදම් කළ හැකි ආදායමේ උපරිමය.*

(අ) එම තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දේ හා ධන බද්දේ, සහ

(ආ) එම තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් මේ පනත යටතේ ගෙවිය යුතු වන සාමාන්‍ය දායක මුදලේ

මුළු එකතුවට වැඩි වන අවස්ථාවක ඒ අතිරික්තය ඒ පුද්ගලයාගේ විය පැහැදම් කළ හැකි ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ විය පැහැදම් කළ හැකි ආදායම රුපියල් විසි හතර දහසකට වැඩි වන අවස්ථාවක ඔහු විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ විශේෂ දායක මුදල වශයෙන් ඒ අතිරික්ත මුදල කොමසාරිස්වරයා මාර්ගයෙන් අරමුදලට ගෙවිය යුතු ය.

14. 11 වන වගන්තිය යටතේ හෝ 13 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන දායක මුදල්වලින් අමාත්‍යවරයා විසින් මෙ වගන්තිය යටතේ සාදනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන යම් නියමයක විධිවිධාන යටතේ ඒ තැනැත්තාට හිමිකම් ඇත්තා වූ යම් අඩු කිරීමක මුදල අඩු කරනු ලැබිය යුතු ය. *දායක මුදල්වලින් කරනු ලබන අඩු කිරීම.*

මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි එය පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියමයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතු ය. යම් නියමයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### දායක මුදල් ගෙවිය යුතු ආදායම හෝ විශේෂ ආදායම එය ගෙවිය යුතු තැනැත්තා විසින්ම තක්සේරු කිරීම සහ ඒ වෙනුවෙන් දායක මුදල ගෙවීම

දායක මුදල් ගෙවිය යුතු ආදායම හෝ විශේෂ ආදායම එය ගෙවිය යුතු තැනැත්තා විසින්ම තක්සේරු කිරීම.

**15.** මේ පනත යටතේ යම් දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබූ සෑම තැනැත්තකුම—

(අ) ඔහු නිශ්චිතව සඳහන් සමාගමක් නොවන තැනැත්තකු නම් තමාගේ දායක මුදල් ගෙවිය යුතු ආදායම තක්සේරු කර ගත යුතු ය.

(ආ) ඔහු නිශ්චිතව සඳහන් සමාගමක් නම්, එම සමාගමේ විශේෂ ආදායම තක්සේරු කර ගත යුතු ය.

දායක මුදල් ගෙවීම.

**16.** (1) 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ ගෙවිය යුතු වන යම් දායක මුදලක් ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා මාර්ගයෙන් වාර කොටස් හතරකින් අරමුදලට ගෙවිය යුතු ය. ඒ එක් එක් වාර කොටස මෙහි මින් මතු "කාර්තු වාර කොටස" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) 1972 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ මුල් කාර්තු වාර කොටස් දෙක 1973 ජනවාරි මස පසළොස්වන දින හෝ එදිනට පෙර ද ඊළඟ කාර්තු වාර කොටස් දෙක පිළිවෙලින් 1973 පෙබරවාරි මස පසළොස් වන දින හෝ එදිනට පෙර හා අප්‍රේල් මස තිස් වන දින හෝ එදිනට පෙර ද ගෙවිය යුතු අතර අනතුරුව එන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ කාර්තු වාර කොටස් පිළිවෙලින් එම තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල පසළොස් වන දින හෝ ඊට පෙර ද ඊළඟ තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස තිස් වන දින හෝ ඊට පෙර ද ගෙවිය යුතු ය.

(3) තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන දායක මුදලේ කාර්තු වාර කොටස් පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) පළමුවන කාර්තු වාර කොටස එම තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු දායක මුදලෙන් හතරෙන් එක් කොටසකට සමාන විය යුතු ය;

(ආ) දෙවන කාර්තු වාර කොටස ඒ තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු දායක මුදලේ දෙකෙන් කොටසක් හා එම තක්සේරු වර්ෂයේ පළමුවන කාර්තු වාර කොටස හා අතර වෙනසට සමාන මුදලක් විය යුතු ය;

(ඇ) තුන්වන කාර්තු වාර කොටස ඒ තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු දායක මුදලේ හතරෙන් තුන් කොටසක් හා ඒ තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂයේ පළමුවන සහ දෙවන කාර්තු කොටස් වශයෙන් ගෙවිය යුතු වන මුදල හා අතර වෙනසට සමාන මුදලක් විය යුතු ය;

(ඈ) හතරවන කාර්තු වාර කොටස ඒ තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු දායක මුදලේ හා එම තක්සේරු වර්ෂය සඳහා වූ පළමුවන, දෙවන සහ තුන්වන කාර්තු වාර කොටස්වල මුදල හා අතර වෙනසට සමාන මුදලක් විය යුතු ය.

(4) තනිව හෝ පවුලක ප්‍රධානියකු වශයෙන් හෝ තක්සේරු වර්ෂයක් සඳහා යම් දායක මුදලක කාර්තු වාර කොටසක් ගෙවන්නා වූත් නිශ්චිතව සඳහන් සමාගමක් නොවන්නා වූත් සෑම තැනැත්තකු විසින්, ඒ වාර කොටස ගෙවන විට, එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ දායක මුදල් ගෙවිය යුතු ආදායම පිළිබඳ වාර්තාවක් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතුය. ඒ වාර්තාව නියමිත ආකෘතියෙහි විය යුතු අතර එම ආකෘතියේ නිශ්චිතව සඳහන් කරුණු අතුරින් ඔහුට අදාළ කරුණු පිළිබඳ විස්තර එම වාර්තාවෙහි අඩංගු විය යුතු ය.

(5) තක්සේරු වර්ෂයක් සඳහා යම් දායක මුදලක කාර්තු වාර කොටසක් ගෙවන්නා වූ සෑම නිශ්චිතව සඳහන් සමාගමක් විසින්, ඒ වාර කොටස ගෙවන විට, එම තක්සේරු වර්ෂය සඳහා වූ එම සමාගමේ දායක මුදල් ගෙවිය යුතු ආදායම පිළිබඳ වාර්තාවක් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු ය. ඒ වාර්තාව නියමිත ආකෘති යෙහි විය යුතු අතර එම ආකෘතියෙහි නිශ්චිතව සඳහන් කරුණු අතුරින් එම සමාගමට අදාළ කරුණු පිළිබඳ විස්තර එම වාර්තාවෙහි අඩංගු විය යුතු ය.

(6) (7) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි හෝ ඊට පෙර කාර්තු කොටසක් ගෙවනු නො ලැබූ විට එසේ ගෙවනු නො ලැබූ මුදල ගෙවීම පැහැර හරින ලද මුදලක් ලෙස ද එය ගෙවිය යුතු තැනැත්තා පැහැර හරින්නෙකු ලෙස ද මේ පනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු අතර දායක මුදල් අයකර ගැනීම පිළිබඳ වූ මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(7) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ දායක මුදලක් ගෙවීමට යටත් යම් තැනැත්තකු, ඒ දායක මුදලේ කාර්තු කොටසක් ගෙවීමට ඔහුට නියමව ඇත්තේ යම් දිනයක දී හෝ එදිනට පෙර ද ඒ දිනය නොඉක්මවා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් තමාට ගෙවීමට ඇති යම් නිශ්චිතව දන්නා මුදලකින් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තමාගේ බැරට ඇති මුදල්වලින් හෝ කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් විශ්‍රාම වැටුපකින් හෝ අර්ථසාධක අරමුදලකින් තමාට ගෙවිය යුතු මුදලකින් ඒ වාර කොටස ගෙවීමට තමා කටයුතු සලස්වා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් කරන්නා වූ හා ඒ වාර කොටස ගෙවීමට කොමසාරිස්වරයා වැඩි කළ කාලයක් දෙන්නා වූ අවස්ථාවක ඒ දායක මුදල හෝ එහි ඒ වාර කොටස, එය ගෙවීමට ඉඩ දෙන ලද කාලය ගත වන තුරු, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(8) මියගිය තැනැත්තකුගේ බූදල් බලකරු එම තැනැත්තාගේ අන්තිම කැමති බලපත්‍රය හෝ බූදල් පරිපාලන බලපත්‍රය තමා වෙත ප්‍රදානය කරන තෙක් එම බූදලයෙන් මේ පනත යටතේ දායක මුදල් වශයෙන් අයවිය යුතු යම් මුදලක්

ගෙවීමට තමා අපොහොසත් බවට කොමසාරිස්වරයා සෑහීමට පත් කරන අවස්ථාවක, අන්තිම කැමති බලපත්‍රය හෝ මුදල් පරිපාලන බලපත්‍රය ඔහු වෙත ප්‍රදානය කළ දිනයෙන් පසු මාස දෙකක කාල පරිච්ඡේදයක් ඇතුළත ගෙවනු ලබතහොත්, ඒ මුදල්, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි "මුදල් බලකරු" යන යෙදුමට මිය ගිය තැනැත්තකුගේ දේපළෙහි සන්තකය ලබාගන්නා හෝ ඒ දේපළ පිළිබඳව අයුතු ලෙස මැදිහත් වන යම් තැනැත්තෙක් ඇතුළත් නොවේ.

(9) ගෙවීම පැහැර හැරීම දායක මුදලේ කාර්තු වාර කොටසක සම්පූර්ණ මුදලම සම්බන්ධයෙන් වුවත් ඉන් යම් කොටසක් සම්බන්ධයෙන් වුවත් එසේ පැහැර හැරි අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද මුදලට අමතරව,—

(අ) ඒ මුදලේ සියයට පහකට සමාන මුදලක්, සහ

(ආ) ගෙවීම පැහැර හැරි බවට පත්වීමෙන් පසු දින තිහක් ගතවීමට පෙර මුදල ගෙවනු නො ලැබුවහොත්, එය ගෙවීම පැහැර හැර තිබෙන තිස් දිනක එක් එක් වැඩිපුර කාල පරිච්ඡේදය හෝ ඉන් යම් කොටසක් වෙනුවෙන් මුදලේ සියයට එකකට සමාන වැඩිමනත් මුදලක්

පැහැර හරින්නා විසින් දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු ය.

තක්සේරුකරුවන් විසින් තක්සේරු කිරීම.

17. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දායක මුදලක් ගෙවීමට යටත් බව තක්සේරුකරු අදහස් කරන යම් තැනැත්තකු එම තක්සේරු වර්ෂය සඳහා වූ දායක මුදලෙහි කාර්තු වාර කොටසක් ගෙවීම පැහැර හරිනහොත් ඒ තැනැත්තා විසින් ඒ වාර කොටස වශයෙන් ගෙවිය යුතුව තිබූ මුදල එම තක්සේරු වර්ෂය තුළ දී හෝ එම තක්සේරු වර්ෂය ගත වී අවුරුදු හයක් ඇතුළත තක්සේරුකරු විසින් තක්සේරු කළ හැකි ය. ඉක්බිති එසේ තක්සේරු කරන ලද මුදල නොපමාව ගෙවන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඔහු විසින් ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් දායක මුදලක කාර්තු වාර කොටසේ මුදල පිළිබඳව (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවක් 16 වන වගන්තියේ (9) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් දණ්ඩනයට යටත්වීමට ඒ තැනැත්තාගේ බැඳී සිටීම කෙරෙහි බල නොපෑ යුතු අතර එසේ තක්සේරු කරන ලද මුදල ඒ වගන්තියේ විධිවිධාන අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබූ කාර්තු වාර කොටස වශයෙන් ඒ වගන්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දායක මුදලක් ගෙවිය යුතු යම් තැනැත්තකු විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා වූ දායක මුදලේ කාර්තු කොටස වශයෙන් ගෙවිය යුතු නිසි දායක මුදලට අඩු මුදලක් කාර්තු කොටස ලෙස ගෙවන ලද අවස්ථාවක, එම තක්සේරු වර්ෂය තුළ දී හෝ එම තක්සේරු වර්ෂය ගතවීමෙන් පසු අවුරුදු හයක් ඇතුළතදී තක්සේරුකරුගේ තිරණය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය

යුතුව තිබූ මුදල තක්සේරුකරු විසින් තක්සේරු කළ හැකිය. ඉක්බිතිව ඒ තැනැත්තා විසින් ගෙවූ මුදල හා එසේ තක්සේරු කළ මුදල හා අතර වෙනස නොපමාව ගෙවන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඔහුට නියම කළ හැකි ය :

එසේ වුවද මේ උපවගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවල කිසිවක් මේ උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද යම් තැනැත්තකු සම්බන්ධයෙන් අතිරේක තක්සේරුවක් කිරීමෙන් තක්සේරුකරුවකු වළක්වන්නක් නො විය යුතුය.

(4) යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවක ප්‍රතිඵල වශයෙන් එම උප වගන්තිය යටතේ කෙරෙන දැන්වීමකින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදලක් ගෙවීමට ඒ තැනැත්තාට නියම කරනු ලැබූ අවස්ථාවක, එම මුදල වෙනුවෙන් 16 වන වගන්තියේ (9) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් දණ්ඩනය ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතු අතර එම මුදල එම වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබූ නමුත් නොගෙවා හරින ලද කාර්තු කොටස වශයෙන් එම වගන්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

## V වන කොටස

### අභියාචනා

**18.** (1) අරමුදලට ගෙවිය යුතු යම් දායක මුදලක කාර්තු වාර කොටස් ගෙවීමට මේ පනතින් නියමිත තැනැත්තකු වූ යම් තැනැත්තකු 17 වන වගන්තිය යටතේ තමා පිළිබඳව කරන ලද යම් තක්සේරු කිරීමක් ගැන සෑහීමට පත් නොවුවහොත් ඒ තක්සේරු දැන්වීමේ දිනයෙන් පසු දින තිහක් ඇතුළත ඒ තක්සේරුවට විරුද්ධව කොමසාරිස්වරයා වෙත අභියාචනා කළ හැකි ය : කොමසාරිස්වරයා වෙත අභියාචන.

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නො සිටීම හෝ අසනීපවීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් හෝ නිසා යම් තැනැත්තකු අභියාචනා කිරීමට ඉඩ හැර ඇති කාලය ඇතුළත අභියාචනය ඉදිරිපත් කිරීමෙන් වැළැක්වී ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත් ඔහුගේ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට වැඩි කළ කාලයක් දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනා පෙත්සමක් ම—

(අ) ලියවිල්ලකින් විය යුතු ය,

(ආ) කොමසාරිස්වරයාට නම් කළ යුතුය,

(ඇ) ආයාචනයට හේතු පැහැදිලිවම එහි සඳහන් විය යුතු ය,

(ඈ) අභියාචක හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා විසින් අත්සන් කළ යුතු ය.

(3) විරුද්ධව අභියාචනා කරනු ලබන තක්සේරුව ඉදිරිපත් කිරීම 16 වන වගන්තිය යටතේ නියමිත වාර්තාව නොමැතිව කරනු ලැබ ඇති අවස්ථාවක යථා පරිදි පිළියෙල කළ වාර්තාවක් සමග අභියාචනා පෙත්සම එවිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන කිසිම අභියාචනා පෙත්සමක් වලංගු නො විය යුතු ය.

(5) වලංගු අභියාචනා පෙත්සමක් ලැබුණු විට කොමසාරිස්වරයා විසින් තක්සේරුකරුවකු ලවා තවදුරටත් පරීක්ෂාවක් කරවනු ලැබිය හැකි අතර එසේ පරීක්ෂා කිරීමේ දී අභියාචනා පෙත්සමෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් එකඟවීමක් ඇති වුවහොත් තක්සේරුවෙහි අවශ්‍ය වෙනස් කිරීම් කළ යුතු ය.

(6) අභියාචක හා තක්සේරුකරු හා අතර (5) වන උපවගන්තියෙහි විධිවිධාන සැලැස්වුණු ආකාරයට එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, අභියාචනය තහවුරු කිරීමට අභියාචක පිහිට බලාපොරොත්තු වන ලේඛනවල ද එවැනි සාක්ෂි ලබා ගැනීමට සිටින තැනැත්තන්ගේ නම් හා නිල නාමවල ද ලැයිස්තුවක් තම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත තමහට වෙත එවන ලෙස අභියාචකට දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් ඔහුට නියම කළ යුතු ය.

(7) (6) වන උපවගන්තියෙහි සඳහන් ලැයිස්තුව තමා වෙත එවනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් කොමසාරිස්වරයා විසින් අභියාචනය පිළිබඳ තමාගේ නිශ්චය කිරීම ලියවිල්ලකින් වූ දැන්වීමකින් අභියාචකට දැනුම් දිය යුතු ය.

(8) යම් අභියාචනයක් සම්බන්ධයෙන් තමාගේ නිශ්චය කිරීමට පෙර පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම අවශ්‍ය බව කොමසාරිස්වරයා සලකතහොත්, ඔහු විසින්, අභියාචකට කරනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්—

(අ) (6) වන උපවගන්තියේ සඳහන් ලැයිස්තුවෙහි නිශ්චිතව සඳහන් යම් ලේඛනයක් කොමසාරිස්වරයා විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ එවන ලෙස අභියාචකට නියම කළ හැකිය ;

(ආ) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් අභියාචනයට අදාළ කරුණු සම්බන්ධයෙන් විභාග කිරීම පිණිස දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ස්ථානයේ දී දිනයේ දී හා වේලාවේ දී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ලේඛන හා සාක්ෂිකරුවන් ද රැගෙන පුද්ගලිකව හෝ බලය ලත් නියෝජිතයකු මාර්ගයෙන් හෝ පෙනී සිටින ලෙස අභියාචකට නියම කළ හැකි ය ;

(ඇ) (6) වන උපවගන්තියේ සඳහන් ලැයිස්තුවේ නම් කර ඇති යම් තැනැත්තකුගේ ලිඛිත සාක්ෂි දිවුරුම් පෙත්සමකින් හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් අන් කිසි ආකාරයකින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත සපයන ලෙස අභියාචකට නියම කළ හැකි ය.

(9) (6) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම අභියාචකයකු පැහැර හරින අවස්ථාවක කොමසාරිස්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතු ය :

එසේ වුව ද, අභියාචනය නිෂ්ප්‍රභ කිරීමෙන් පසු යුක්තිසහගත කාලයක් ඇතුළත ශ්‍රී ලංකාවෙහි තමා නොසිටි නිසා හෝ තමා අසනීපවීම නිසා හෝ වෙනත් නො වැළැක්විය හැකි හේතුවක් නිසා දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීමෙන් තමන් වැළැක්වුණු බවට අභියාචක විසින් කොමසාරිස්වරයා සෑහීමට පත් කරත හොත් නිෂ්ප්‍රභ කිරීමේ නියමය කොමසාරිස්වරයා විසින් අස්කර ගත හැකි ය.

(10) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි බව කොමසාරිස්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතු අතර ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් ඔහු විසින් පරීක්ෂා කළ හැකි ය. එසේ ඇමිණ පෙනී සිටීමෙහි ලා ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් දරන ලද යම් යුක්තිසහගත වියදමකට කොමසාරිස්වරයා විසින් ඉඩ දෙනු ලැබිය හැකි ය.

(11) අභියාචනයක් සම්බන්ධයෙන් තමාගේ නිශ්චය කිරීමට අවශ්‍ය යම් තොරතුරක් ලබා ගැනීමේ කාර්යය සඳහා, තම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඔප්පු, පිඹුරු, නීත්‍යනුකූල ලේඛන, පොත්, ගණන්, නාමලේඛන, චෙක්පත්, මුදල් බාරදෙන පත්‍රිකා, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන යන මේ කිසිවක්, එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ, පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ තමා වෙත එවන ලෙස කොමසාරිස්වරයා විසින් ලියවිල්ලෙන් වූ දැන්වීමකින්, ඒවා සන්තකව ඇති යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(12) අභියාචනයට අදාළ වූ ද (8) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වූ ද යම් කරුණක් සම්බන්ධයෙන් විභාග කරනු ලැබීමට පෙනී සිටින මෙන් අභියාචකට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට නියම කරනු ලැබූ අවස්ථාවක ඒ විභාගයේ දී—

(අ) (6) වන උපවගන්තිය යටතෙහි ඔහු විසින් සපයනු ලැබූ ලැයිස්තුවෙහි ඇතුළත් නොවූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ ඒ ලැයිස්තුවෙහි නම සඳහන්ව නැති යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට, හෝ

(ආ) අභියාචනා පෙත්සමෙහි සඳහන් කර නැති යම් කරුණක් මතුකිරීමට

අභියාචකට ඉඩ නො දිය යුතු ය.

(13) මේ වගන්තිය යටතේ අභියාචනයක් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමේදී විරුද්ධව අභියාචනා කරනු ලැබූ තක්සේරුව කොමසාරිස්වරයා විසින් වැඩි කළ හැකි ය.

**19.** ප්‍රධාන පනතේ 98 වන වගන්තියෙහි විධිවිධාන මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ විය යුතු ය. සමාලෝචන මණ්ඩලයේ සංයුතිය.

**20.** ප්‍රධාන පනතේ 99 වන වගන්තියෙහි විධිවිධාන ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් ද එම පනතේ අන් කිසි වගන්තියක් පිළිබඳව එම වගන්තියෙහි ඇති යම් සඳහනක් මේ පනතෙහි 18 වන වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද අදාළ විය යුතු ය. සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීමේ අයිතිය.

2—ජේ 17355 (72/10)

කොමසාරිස්වරයා විසින් අභියාචනා සමාලෝචන මණ්ඩලය වෙත යොමු කළ හැකි බව.

21. ප්‍රධාන පනතෙහි 100 වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් ද ඒ පනතේ 97 වන වගන්තිය පිළිබඳව එම වගන්තියේ ඇති සඳහන මේ පනතේ 18 වන වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද ඒ පනතේ 101 වන වගන්තිය පිළිබඳව එහි ඇති සඳහන මේ පනතේ 22 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට අදාළ කරනු ලැබූ එම වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අභියාචනා විභාග කිරීම හා ඒවා පිළිබඳව යුදුස්සක් කිරීම.

22. ප්‍රධාන පනතෙහි 101 වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන්, සහ—

(අ) ඒ පනතෙහි 100 වන වගන්තිය පිළිබඳව ඒ වගන්තියෙහි ඇති සඳහන මේ පනතේ 21 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ඒ වගන්තියේ විධිවිධාන පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද ;

(ආ) ඒ පනතෙහි 97 (7) වන වගන්තිය පිළිබඳ සඳහන මේ පනතෙහි 18 වන වගන්තියේ (6) වන උපවගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද ;

(ඇ) ඒ පනතෙහි 97 වන වගන්තියේ (9) වන උපවගන්තිය පිළිබඳ සඳහන මේ පනතේ 18 වන වගන්තියේ (8) වන උපවගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද ;

අදාළ විය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීම.

23. ප්‍රධාන පනතෙහි 102 වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් සහ බදු වෙනුවට දායක මුදල් සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් අදාළ විය යුතු ය.

තක්සේරු කරන ලද මුදල යම් අභියාචනයක් නොතකා ගෙවිය යුතු බව.

24. (1) මේ කොටස යටතේ විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති තක්සේරුවක් අනුව ගෙවීමට නියමිත මුදල ඒ මුදල හෝ එහි යම් කොටසක් හෝ ගෙවීම අභියාචනයේ ප්‍රතිඵල ලැබෙන තුරු පසුවට තැබිය යුතු යයි කොමසාරිස්වරයා නියමයක් කරතහොත් මිස, අභියාචනය ගැන නොතකා ගෙවිය යුතු ය. ගෙවීම එසේ පසුවට තුබූ මුදල ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සලකනු නො ලැබිය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තියෙහි ඉහත දක්වුණු විධිවිධාන යටතේ වූ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කොට අවස්ථාවට අවශ්‍ය බව තමාට පෙනී යා හැකි අලුත් නියමයක් කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකි අතර අලුත් නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයෙහි හෝ එදිනට පෙර නො ගෙවන ලද යම් මුදලක් ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අභියාචනයක් පිළිබඳ අවසාන නිශ්චය කිරීම අනුව හෝ කොමසාරිස්වරයාගේ යම් නියමයක් අනුව, (1) වන උපවගන්තිය යටතේ ගෙවීම පසුවට තැබූ යම් මුදලක් ගෙවිය යුතු බවට ඒ පත්වූ හෝ මුල් තක්සේරුවෙන් ගෙවීමට නියම වූ හෝ මුදල වැඩි කරනු ලැබූ අවස්ථාවක එම මුදල හෝ එසේ වැඩි කරන ලද මුදල යම්

දිනයක හෝ එදිනට පෙර ගෙවිය යුතු ද ඒ දිනය නියම කරමින්, කොමසාරිස්වරයා විසින් ඒ මුදල ගෙවිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා වෙත ලියවිල්ලෙන් වූ දැන්වීමක් කළ යුතු ය. ඒ අනුව නො ගෙවන ලද යම් මුදලක් ගෙවීම පැහැර හැරි මුදලක් ලෙස සැලකිය යුතු අතර එසේ වූ විට ගෙවීම පැහැර හරින ලද මුදලට අමතරව,—

(අ) ඒ මුදලෙන් සියයට පහකට සමාන මුදලක් ; හා

(ආ) ගෙවීම පැහැර හැරි බවට පත්වීමෙන් පසු දින තිහක් ගත වීමට පෙර මුදල ගෙවනු නො ලැබුවහොත්, එය ගෙවීම පැහැර හැර තිබෙන තිස් දිනක එක් එක් වැඩිපුර කාල පරිච්ඡේදය හෝ ඉන් යම් කොටසක් වෙනුවෙන් මුදලෙන් සියයට එකකට සමාන වැඩිමනත් මුදලක්

පැහැර හරින්නා විසින් දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු ය.

(3) 10 වන වගන්තිය යටතේ දණ්ඩනයක් ගෙවිය යුතු යම් මුදලක් අභියාචනයක් පිළිබඳ අවසාන නිශ්චය කිරීමක දී අඩු කරනු ලැබූ අවස්ථාවක එම දණ්ඩනය එසේ අඩුකරන ලද මුදල අනුව ගණන් බැලිය යුතු ය.

25. මේ පනත යටතේ කරන ලද තක්සේරුවකට විරුද්ධව 18 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක හෝ තක්සේරුව පිළිබඳ එම වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යම් එකඟවීමකට එළඹ ඇති අවස්ථාවක හෝ තක්සේරුවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් එම වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ නිෂ්ප්‍රභ කරනු ලැබූ අවස්ථාවක හෝ කරන ලද අභියාචනයක දී තක්සේරුවක් සම්බන්ධයෙන් නිශ්චයක් කරන ලද අවස්ථාවක, කරන ලද නැත හොත් එකඟ වූ නැතහොත් අභියාචනයක දී නිශ්චය කරනු ලැබූ තක්සේරුව මේ පනතේ සියලු කාර්යයන් සඳහා අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය : තක්සේරුවල අවසානාත්මක භාවය.

එසේ වුව ද මේ පනතෙහි කිසිවක්, අභියාචනයක දී නිශ්චය කර ඇති යම් කරුණක් නැවත මතු කිරීමක් නොවන තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් යම් තක්සේරු වර්ෂයක් හෝ යම් තක්සේරු වර්ෂයක යම් කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් කිරීමෙන් තක්සේරුකරුවකු වළක්වන්නක් නො විය යුතු ය.

## VI වන කොටස

### දායක මුදල් අයකර ගැනීම

26. මේ කොටසෙහි "දායක මුදල" යන්නට දායක මුදලෙහි කොටසක් ද යම් නිශ්චිත ව සඳහන් මුදලක් ද ගෙවූ දඩ, දණ්ඩන හා දැරූ කවර වූ හෝ ආකාරයේ ගාස්තු හෝ වියදම් කිසිවක් ද ඇතුළත් වේ. දායක මුදල්වලට දඩ ආදිය ඇතුළත් බව.

ගෙවීම පැහැර හරින ලද දායක මුදලක් ප්‍රථම වැය බරක් විය යුතු බව.

27. ගෙවීම පැහැර හරින ලද යම් දායක මුදලක් එය ගෙවීම පැහැර හරින්නාගේ වත්කම් කෙරෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය:

එසේ වුව ද—

(අ) ප්‍රධාන පනතේ 110 වන වගන්තියේ විධිවිධාන මේ පනතේ 28 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට මේ පනතේ විධිවිධාන වූ ලෙස අදාළ කරනු ලැබුවාක් මෙන් ඒ විධි විධාන අනුව, තහනමට ගැනීමට පෙර නිර්ව්‍යාජ ගැණුම්කරුවකුට පැහැර හරින්නා විසින් වටිනාකමට විකුණන ලද වත්කම් කිසිවක් අහුවන පරිදි ඒ වැය බර ක්‍රියාත්මක නො විය යුතු ය; නැතහොත් ඒ වත්කම් කෙරෙහි එය බල නො පැවැත්විය යුතු ය;

(ආ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, නිර්ව්‍යාජ ලෙස වටිනාකම සඳහා ඇති කර ගනු ලැබ පැහැර හරින්නා සම්බන්ධයෙන් තක්සේරුව කරන ලද දිනයට පෙර ලියා පදිංචි කරන ලද යම් බද්දකට හෝ බැඳීමකට ඉහලින් ගෙවීම පැහැර හරින ලද යම් දායක මුදලකට ප්‍රමුඛත්වය නො ලැබිය යුතු ය;

(ඇ) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, ගෙවීම පැහැර හැරි දිනයට පෙර නිර්ව්‍යාජ ලෙස වටිනාකම සඳහා ඇති කර ගනු ලැබූ යම් බද්දකට හෝ බැඳීමකට ඉහලින් ගෙවීම පැහැර හරින ලද යම් දායක මුදලකට ප්‍රමුඛත්වය නො ලැබිය යුතු ය.

දේපළ තහනමට ගෙන විකිණීමෙන් දායක මුදල් අයකර ගැනීම.

28. ප්‍රධාන පනතේ 110 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ බදු එකතු කරන්නාත්, බදු සහ බදු එකතු කරන්නා වෙනුවට දායක මුදල් එකතු කරන්නාත්, දායක මුදල් සහ දායක මුදල් එකතු කරන්නා සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් අදාළ විය යුතු ය.

දායක මුදල් අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු කෘත්‍යය.

29. ප්‍රධාන පනතේ 111 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ ඒ වගන්තියේ බදු පිළිබඳ සඳහන් කිරීම් දායක මුදල් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ප්‍රධාන පනතේ 103 වන වගන්තිය පිළිබඳ සඳහන මේ පනතේ 25 වන වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් අදාළ විය යුතු ය.

දායක මුදල් ණයවලින් අයකර ගැනීම.

30. ප්‍රධාන පනතේ 112 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් සහ ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද—

(අ) ඒ වගන්තියෙහි බදු පිළිබඳ සඳහන් කිරීම් දායක මුදල් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන්; සහ

(ආ) එහි (1) වන උපවගන්තියෙහි "පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු" යන වචන වෙනුවට "පැහැර හරින්නා වෙත හෝ ඔහුගේ නියෝජිතයා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් ද

අදාළ විය යුතු ය.

31. ප්‍රධාන පනතේ 113 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් ද—

ශ්‍රී ලංකාව හැර යන තැනැත්තන්ගෙන් දායක මුදල් අයකර ගැනීම.

(අ) ඒ වගන්තියෙහි බදු පිළිබඳ සඳහන් කිරීම් දායක මුදල් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් ; සහ

(ආ) එහි (1) වන උපවගන්තියෙහි "තමා සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ සියලු ම ආදායම් බදු, ධනබදු හෝ තෑගි බදු" යන වචන වෙනුවට "තමා විසින් ගෙවිය යුතු දායක මුදල" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් ද

අදාළ විය යුතු ය.

32. ප්‍රධාන පනතේ 114 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් සහ ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද—

අයකර ගැනීමේ මාර්ග එකකට වැඩි ගණනක් යොදා ගැනීම.

(අ) ඒ වගන්තියෙහි—

(i) "පරිච්ඡේදයේ" යන වචනය යෙදී ඇති කවර ස්ථානයක වුව ද ඒ වචනය වෙනුවට "කොටසේ" යන වචනය ; සහ

(ii) "යම් බද්දක මුළුගණන" යන වචන යෙදී ඇති කවර ස්ථානයක වුව ද ඒ වෙනුවට "යම් දායක මුදලක මුළු ගණන" යන වචන

ආදේශ කරනු ලැබුවාක් මෙන් ; සහ

(ආ) ප්‍රධාන පනතෙහි 111 වන වගන්තිය පිළිබඳ සඳහන මේ පනතේ 29 වන වගන්තියේ දක්වන ලද ආකාරයට අදාළ කළ එකී 111 වන වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද

අදාළ විය යුතු ය.

33. ප්‍රධාන පනතෙහි 115 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් සහ එහි "යම් ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු" යන වචන වෙනුවට "සම්පූර්ණ දායක මුදල හෝ ඉන් කොටසක්" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් අදාළ විය යුතු ය.

දායක මුදල් අයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමට කොමසාරිස්වරයා සතු බලය.

34. (1) පවුලක ප්‍රධානයා වූ තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් දායක මුදලක් ගෙවීම පැහැර හැර ඇත්තා වූ හා ඔහුගෙන් අයකර ගත නොහැක්කා වූ අවස්ථාවක, ඔහුගේ භාර්යාව හෝ දරුවා ඒ පවුලට ඇතුළත් නම් ඒ භාර්යාවගේ හෝ දරුවාගේ ලාභවලට හෝ ආදායමට ආරෝපණය කළ හැකි බව කොමසාරිස්වරයාට පෙනී යන එකී දායක මුදලෙහි කොටස ඒ භාර්යාව හෝ දරුවා පිළිබඳ ව තක්සේරුවක් කර නොමැති වුව ද ඒ භාර්යාවගෙන් හෝ දරුවාගෙන් එකතු කර ගැනීම හෝ අයකර ගැනීම කළ හැකි අතර දායක මුදල් එකතු කර ගැනීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතෙහි ඇති විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

ගෙවීම පැහැර හැරි තැනැත්තන්ගෙන් හැර වෙනත් තැනැත්තන්ගෙන් දායක මුදල අයකර ගත හැකි අවස්ථා.

(2) මිය ගිය තැනැත්තකුගේ බූදලයෙහි උරුමකරුවකු වන යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් දායක මුදලක් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක, ඒ තැනැත්තාට එම බූදලයෙන් ලැබීමට

හිමිකම් ඇති ලාභවලට හෝ ආදායමට ආරෝපණය කළ හැකි බව කොමසාරිස්වරයා අදහස් කරන එකී දායක මුදලෙහි කොටස මියගිය තැනැත්තාගේ බූදල් බලකරු පිළිබඳ ව තක්සේරුවක් කර නො මැති වුව ද ඒ බූදල් බලකරුගෙන් අයකර ගනු ලැබිය හැකි අතර දායක මුදල් එකතු කර ගැනීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතෙහි ඇති විධිවිධාන ඒ බූදල් බලකරු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. එසේ බූදල් බලකරුගෙන් එකතු කර ගන්නා ලද හෝ අය කර ගන්නා ලද මුදල එකී තැනැත්තාට ගෙවිය යුතු වන ආදායමෙන් අඩුකර ගැනීමට ඒ බූදල් බලකරුට හිමිකම තිබිය යුතු ය.

(3) භාරයක් යටතේ වූ අර්ථලාභියකු විසින් ගෙවිය යුතු යම් දායක මුදලක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ අර්ථලාභියාට එම භාරයෙන් ලැබීමට හිමිකම් ඇති ලාභවලට හෝ ආදායමට ආරෝපණය කළ හැකි බව කොමසාරිස්වරයා අදහස් කරන එකී දායක මුදලෙහි කොටස එම භාරයෙහි භාරකරු පිළිබඳව තක්සේරුවක් කර නොමැති වුව ද ඒ භාරකරුගෙන් අය කර ගනු ලැබිය හැකි අතර දායක මුදල් එකතු කර ගැනීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතෙහි ඇති විධිවිධාන ඒ භාරකරු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ඒ දායක මුදල හෝ එහි කොටස ඒ අර්ථලාභියාට භාරයෙන් ගෙවිය යුතු වන ආදායමෙන් අඩු කර ගැනීමට ඒ භාරකරුට හිමිකම තිබිය යුතු ය.

## VII වන කොටස

### වැරදි සහ දණ්ඩන

දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම හා වාර්තා සැපයීම පැහැර හැරීම, වැරදි වාර්තා සැපයීම ආදිය.

35. (1) යම් තැනැත්තෙක්—

(අ) මේ පනතෙහි 33 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ප්‍රධාන පනතෙහි 115 වන වගන්තියේ විධිවිධාන යටතේ තමා වෙත දෙන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරියි ද; නැතහොත්

(ආ) මේ පනතෙහි 22 වන වගන්තියේ සඳහන් ආකාරයට මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ප්‍රධාන පනතේ 101 වන වගන්තියේ (6) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ නිකුත් කරන ලද දැන්වීමකට පිළිතුරු වශයෙන් පැමිණ පෙනී සිටීම පැහැර හරියි ද; නැතහොත් පැමිණ පෙනී සිට තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සඳහා හේතුවක් නොමැතිව පැහැර හරියි ද

ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (අ) 16 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ (5) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ; හෝ

(ආ) වාර්තාවක් සැපයීමට තමාට නියම කරනු ලැබූ යම් ආදායමක් හෝ ලාභයක් අත් හරිමින් හෝ අඩුවෙන් සඳහන් කරමින් වැරදි වාර්තාවක් සපයන්නා වූ; හෝ

(ඇ) අසත්‍ය බව හෝ වැරදි බව තමා දන්නා විස්තර අඩංගු යම් ලිඛිත තොරතුරක්, ප්‍රකාශයක්, වාර්තාවක්, ලේඛනයක් හෝ අන් කිසි ලියවිල්ලක් මේ පනතේ කාර්යයන් සඳහා සපයන්නා වූ; හෝ

(ඈ) මේ පනත යටතේ යම් දායක මුදලක් ගෙවීමට තමා ගේ බැඳී සිටීම කෙරෙහි බලපාන යම් කරුණක් හෝ දෙයක් පිළිබඳව යම් වැරදි තොරතුරක් දෙන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නො වැඩි දඩයකට හෝ මාස හයකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) යම් වරදක් කරන ලද්දේ යම් තක්සේරු වර්ෂයක් පිළිබඳව හෝ ඇතුළත ද ඒ තක්සේරු වර්ෂයෙහි දී හෝ ඒ තක්සේරු වර්ෂය ගතවීමෙන් පසු අවුරුදු පහක් ඇතුළත දී හෝ පැමිණිලි කරන ලද නම් මිස ඒ වරදට මේ වගන්තිය යටතේ කිසිම තැනැත්තකුට දඬුවම් නොකළ යුතු ය.

රහස්‍යතාව කඩකිරීම ආදී වැරදි.

**36.** (අ) මේ පනතේ 55 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ප්‍රධාන පනතේ 124 වන වගන්තියේ විධිවිධාන වලින් නියමිත පරිදි රහස්‍යතා දිවුරුමක් නොදී මේ පනත යටතේ ක්‍රියා කරන්නා වූ; හෝ

(ආ) මේ පනතේ 55 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ප්‍රධාන පනතේ 124 (1) වන වගන්තියේ විධිවිධානවලට හෝ 124(2) වන වගන්තිය යටතේ දෙන ලද දිවුරුමකට පටහැනිව ක්‍රියා කරන්නා වූ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කිරීමට අන් කිසි තැනැත්තකුට ආධාර දෙන්නා වූ හෝ අනුබල දෙන්නා වූ හෝ පොළඹවන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

වැරදි සමථය පත් කිරීම.

**37.** 35 වන වගන්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින්, සමථය පත් කරනු ලැබිය හැකි අතර නඩු තීන්දුව දීමට පෙර වරද පිළිබඳ යම් නීතිකෘත්‍යයක් නතර කිරීම හෝ සමථය පත් කිරීම කරනු ලැබිය හැකි ය.

නඩු පැවරීම කොමසාරිස්වරයාගේ අනුමතිය ඇතිව කළ යුතු බව.

**38.** කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට හෝ අනුමතය ඇතිව හැර 35 වන වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක් ආරම්භ කළ නො හැකි ය.

වැරදි වාර්තා සඳහා දඩුවම.

**39.** (1) යම් තැනැත්තකු පිළිබඳ ව කරන ලද තක්සේරුවක දැක්වෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් තක්සේරු කරන ලද්දා වූ දායක මුදල් ගෙවිය යුතු ආදායමේ මුදල ඔහුගේ වාර්තාවෙහි තමා දායක මුදල් ගෙවිය යුතු ආදායම වශයෙන් ඔහු විසින් නිශ්චිතව සඳහන් කර ඇති මුදලට වැඩි වන්නා වූ ගා එකී තක්සේරුව 25 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ අවස්ථාවක තමාගේ වාර්තාවෙහි ඒ ආදායම එළිදරව් කිරීමෙහි ලා වංචාවක් හෝ ඕනෑකමින්ම කරන ලද පැහැර හැරීමක් කෙරී නො මැති බව ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනහොත් මිස වැරදි වාර්තාවක් සැපයීම සම්බන්ධයෙන් රුපියල් දෙදහසකට නොවැඩි මුදලක් සහ වැඩි වූ ආදායම සම්බන්ධයෙන් ගෙවිය යුතු දායක මුදල මෙන් දෙගුණයකට සමාන මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් නියමයක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් තමා වෙත එම නියමය නිවේදනය කරනු ලැබීමෙන් පසු දින විසි එකක් ඇතුළත ඒ නියමයට විරුද්ධව සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි ය. නියමයට විරුද්ධ වන හේතු අභියාචනයේ සඳහන් විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ යම් අභියාචනයක් විභාග කර සුදුස්සක් කිරීමේදී මේ පනතේ 22 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් අදාළ කරනු ලැබූ ප්‍රධාන පනතෙහි 101 වන වගන්තියෙහි විධිවිධාන එයට අදාළ විය යුතු ය. කොමසාරිස්වරයා විසින් නියම කරන ලද දණ්ඩනය ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම සමාලෝචන මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි අතර දණ්ඩනය වැඩි කරනු ලබන විට එසේ වැඩි කරනු ලැබූ දණ්ඩනය කොමසාරිස්වරයා විසින් ඒ දණ්ඩනය වශයෙන් (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි උපරිම මුදලට වැඩි නොවිය යුතු ය.

(4) යම් තැනැත්තකු සිය ආදායම් වාර්තාවෙහි යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් හෝ සටහනක් කර තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් (1) වන උපවගන්තිය යටතේ ඔහුට දණ්ඩනයක් නියම කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා ඒ අසත්‍ය හෝ වැරදි සටහන හෝ ප්‍රකාශය සම්බන්ධයෙන් මේ පනත යටතේ නඩු පවරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

දණ්ඩන සඳහා වූ යම් නීතිකෘත්‍යයක් නොතකා දායක මුදල් ගෙවිය යුතු බව.

**40.** මේ කොටස යටතේ නීතිකෘත්‍යයක් පැවරීම හෝ දණ්ඩනයක්, දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කර තිබීම කරණ කොට ගෙන මේ පනත යටතේ තක්සේරු කරනු ලැබීමට යටත් ව සිටීමෙන් හෝ ගෙවීමට යටත් හෝ යටත් විය හැකි යම් දායක මුදලක් ගෙවීමට යටත් ව සිටීමෙන් කිසිම තැනැත්තකු නිදහස් නො විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

41. මේ පනත යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය නීතිගත මණ්ඩලයක් නම් ඒ නීතිගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම හා සෑම නිලධරයකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම

එම වරදට වරදකරු විය යුතු ය :

එසේ වුව ද තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර තිබෙන බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ නීතිගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාරික ආයතනයෙහි හවුල්කරුවකු හෝ ඔප්පු කරතහොත් ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු ලෙස සලකනු නො ලැබිය යුතු ය.

## VIII වන කොටස

### දායක මුදල්වලට අදාළ පොදු විධිවිධාන

ගෙවන ලද දායක මුදල් වෙනුවෙන් සහතික නිකුත් කිරීම.

42. සෑම තැනැත්තකුටම ඔහු විසින් යම් වර්ෂයක මැයි මස පළමුවැනි දිනයෙන් ආරම්භ වන දොළොස් මස් කාලපරිච්ඡේදය තුළ ගෙවන ලද හෝ ඒ කාලය තුළ ඔහුගෙන් අයකර ගන්නා ලද දායක මුදල් වෙනුවෙන් ඔහු විසින් එසේ ගෙවනු ලැබූ හෝ ඔහුගෙන් එසේ අයකර ගනු ලැබූ මුළු දායක මුදල දැක්වෙන සහතිකයක් නිකුත් කරනු ලැබීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

මේ පනත යටතේ ලබාගත් මුදල් ගෙවීම.

43. (1) මේ පනත යටතේ දායක මුදල් වශයෙන් කොමසාරිස්වරයාට ගෙවනු ලැබූ හෝ කොමසාරිස්වරයා විසින් අයකර ගනු ලැබූ සියලු මුදල් ඔහු විසින් අරමුදලට ගෙවිය යුතු ය.

(2) මේ පනත යටතේ නියම කරන ලද දණ්ඩන වශයෙන් කොමසාරිස්වරයා විසින් අයකර ගන්නා සියලු මුදල් ඔහු විසින් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

දායක මුදල් වෙනුවෙන් පොලිය.

44. 42 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක නිශ්චිතව සඳහන් මුදල එම සහතිකය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් වෙනුවෙන් ද එම වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ මැයි මස පළමුවැනි දිනයෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තැන්පත්ව තිබේ නම් ඒ මුදල වෙනුවෙන් පොලිය ගෙවනු ලැබිය යුතු ය. ඒ මැයි මස පළමුවැනි දිනයෙන් ආරම්භ වන මුල් අවුරුදු දෙක වෙනුවෙන් වර්ෂයකට සියයට පහක ප්‍රමාණය අනුව ද අනතුරුව එළඹෙන අවුරුදු වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව ද පොලිය ගෙවිය යුතු ය.

දායක මුදල් ආපසු ගෙවීම.

45. (1) (2) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ දායක මුදල් වශයෙන් ගෙවන ලද්දා වූ ද 42 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයකට ඇතුළත් වූ ද යම් මුදලක් අමාත්‍යවරයා විසින්

නිශ්චය කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූලව, එම සහතික නිකුත් කරන ලද්දේ යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ද එ කාලපරිච්ඡේදය අවසාන වී අවුරුදු දෙකක් ගත වීමෙන් පසු තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ දායක මුදල් වශයෙන් ගෙවන ලද යම් මුදලක්—

(අ) සදහටම ශ්‍රී ලංකාව හැර යතහොත් එසේ යෑමට පෙර කවර විටෙක වුවත් ඔහු විසින් ආපසු ගත හැකි ය; නැතහොත්

(ආ) ඔහුගේ මරණයෙන් පසු ඔහුගේ උරුමකරු, බූදල් බලකරු හෝ බූදල් පරිපාලක විසින් කවර විටෙක වුවත් ආපසු ගත හැකි ය; නැතහොත්

(ඇ) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාර්යයන සඳහා කවර විටෙක වුවත් ආපසු ගත හැකි ය.

මේ ඡේදය යටතේ කරනු ලබන සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නො කරන ලද යම් නියමයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතු ය. යම් නියමයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

ආපසු ගෙවීම.

46. (1) අඩු කරගනු ලැබීමෙන් හෝ අන් ලෙසකින් යම් තක්සේරු වර්ෂයක් සඳහා තමාගෙන් අයවිය යුතු ප්‍රමාණයට වැඩි දායක මුදලක් තමා විසින් ගෙවා ඇති බව එම තක්සේරු වර්ෂය අවසාන වී අවුරුදු තුනක් ඇතුළත යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑමකින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ වැඩියෙන් ගෙවනු ලැබූ මුදල ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ කිසිවක්, අභියාචනා සඳහා අන් කිසි වගන්තියක නිශ්චිතව නියම කර ඇති කාලසීමාව දීර්ඝ කිරීමට හෝ අඩු කිරීමට හෝ අන් ආකාරයකින් අවලංගු විරෝධතා දැක්වීමක් හෝ අභියාචනයක් වලංගු බවට පත්කිරීමට හෝ අවසානාත්මක හා තීරණාත්මක බවට පත් වූ යම් තක්සේරුවක් හෝ වෙනත් කරුණක් ප්‍රතිශෝධනය කිරීමේ බලය පැවරීමට ක්‍රියාත්මක නො විය යුතු ය.

(2) මරණය, බංකොලොත්වීම, ඇවර කිරීම හෝ වෙනත් හේතුවක් කරණකොට ගෙන, ඒ හේතුව නිසා නොවේ නම් (1) වන උපවගන්තිය යටතේ හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමට හිමිකම් තිබුණු තැනැත්තකුට හිමිකම් පෑමක් ඉදිරිපත් කළ

නො හැකි අවස්ථාවක, (1) වන උපවගන්තියෙහි අර්ථානුකූලව වැඩියෙන් ගෙවනු ලැබ ඇති දායක මුදල ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ මුදලයේ ප්‍රයෝජනය පිණිස ගෙවනු ලැබීමට අවශ්‍යාවෝචිත පරිදි ඔහුගේ මුදල් බලකරුට හෝ භාරකරුට හෝ ආදායම භාර ගන්නාට හිමිකම තිබිය යුතු ය.

(3) 16 (9) වන වගන්තිය හෝ 24 (2) වන වගන්තිය යටතේ දණ්ඩනයක් වශයෙන් තමාගෙන් අය විය යුතු මුදලට වැඩි යම් මුදලක් ඒ දණ්ඩනය වශයෙන් තමා විසින් ගෙවා ඇති බව ලියවිල්ලකින් වූ හිමිකම් පෑමකින් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි යම් තැනැත්තකු ඔප්පු කරනු ලැබුවහොත් එම මුදල් ගෙවනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් තුළ දී ද එම වර්ෂය අවසාන වී අවුරුදු තුනක් ඇතුළත ඒ හිමිකම් පෑම ඉදිරිපත් කරන ලද්දේ නම් එසේ වැඩියෙන් ගෙවනු ලැබූ මුදල ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තා හිමිකම ලැබිය යුතු ය.

## IX වන කොටස

## විවිධ කරුණු

47. (1) මේ පනත යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට නියමිත තැනැත්තන්ට කොමසාරිස්වරයා විසින් සහන සැලැස්විය හැකි තත්ත්වයන් ද ප්‍රමාණය ද එසේ කිරීම යටත් කළ යුතු කොන්දේසි ද ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් නිශ්චය කර දැක්විය හැකි ය. සහන සැලැස්වීම.

(2) මේ පනත යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට නියමිත යම් තැනැත්තකුට සහන සැලැස්විය යුතු බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නිවේදනයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තාට කොමසාරිස් වරයා විසින් සහන සලස්වනු ලැබිය හැකි ය.

48. ප්‍රධාන පනතෙහි 87 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් අදාළ විය යුතු ය. අබල වූ හෝ නිර්වාසික වූ හෝ තැනැත්තන් වෙනුවෙන් කවරකුට ක්‍රියා කළ හැකි ද යන වග.

49. ප්‍රධාන පනතෙහි 89 වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් හා ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද එකී 89 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "හෝ 84 වෙනි වගන්තිය අදාළ වන මුදල්, වටිනාකම් හෝ ලාභ ලබන්නාවූ තැනැත්තන් වූ අවස්ථාවක" යන වචන හා ඉලක්කම් ඉවත් කරනු ලැබූවාක් මෙන් ද අදාළ විය යුතු ය. හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව.

50. මියගිය තැනැත්තකුගේ මුදල් බලකරුවන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු ක්‍රියා කරන අවස්ථාවක, මේ පනත යටතේ දායක මුදල් වශයෙන් ගෙවීමට ඔවුන්ට නියමිත මුදල් සම්බන්ධයෙන් එක්ව හෝ වෙන් වෙන්ව ඔවුන්ට වගකීම පවරනු ලැබිය හැකි අතර ඒ මුදල් ගෙවීමට ඔවුන් එක්ව හා වෙන් වෙන්ව බැඳී සිටිය යුතු ය. එක්ව ක්‍රියා කරන මුදල් බලකරුවෝ.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව.

51. ප්‍රධාන පනතෙහි 90වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් හා ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් අදාළ විය යුතු ය.

අත්සන, හා දැන්වීම් භාරදීම.

52. ප්‍රධාන පනතෙහි 91වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් හා ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද ප්‍රධාන පනතේ 95වන වගන්තිය පිළිබඳව එම වගන්තියේ ඇති සඳහන් මේ පනතෙහි 53වන වගන්තිය පිළිබඳ සඳහනක් වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

තක්සේරු කිරීමේ දැන්වීම.

53. තක්සේරුකරුවකු විසින්, මේ පනත යටතේ තක්සේරු කරනු ලැබූ එක් එක් තැනැත්තාට, තක්සේරු කිරීමේ දැන්වීමක් දිය යුතු අතර දායක මුදල් ගෙවිය යුතු ආදායම වශයෙන් තක්සේරු කරන ලද මුදල සහ මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල එම දැන්වීමෙහි සඳහන් විය යුතු ය.

තක්සේරු කිරීම් ආදියෙහි වලංගු භාවය.

54. ප්‍රධාන පනතෙහි 96 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් හා ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "බදු අය කළ හැකි තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ තක්සේරු කරනු ලැබූ ආදායමේ, ධනයේ හෝ තෑගිවල ප්‍රමාණය පිළිබඳව හෝ අය කරනු ලැබූ බදුවල ප්‍රමාණය පිළිබඳව" යන වචන වෙනුවට "දායක මුදල් අය කළ හැකි තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ තක්සේරු කරනු ලැබූ දායක මුදල් ගෙවිය යුතු ආදායම් මුදල හෝ ගෙවිය යුතු දායක මුදල පිළිබඳව" යන වචන ආදේශ කරනු ලැබූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

නිල රහස්‍යතාව.

55. ප්‍රධාන පනතෙහි 124 වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් ද ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද අදාළ විය යුතු ය.

ආකෘති.

56. මේ පනතේ සියලුම කාර්යයන් හෝ යම් කාර්යයක් සඳහා භාවිතා කරනු ලැබිය යුතු ආකෘති කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එසේ නියම කරන ලද යම් ආකෘතියක් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම ද නැතහොත් එසේ නියම කරන ලද යම් ආකෘතියක් වෙනුවට වෙනත් යම් ආකෘතියක් ආදේශ කිරීම ද ඔහු විසින් කළ හැකි ය.

ප්‍රකාශ හා ලේඛන සාක්ෂි වශයෙන් පිළිගත හැකි බව.

57. ප්‍රධාන පනතෙහි 127වන වගන්තියේ විධිවිධාන ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් හා බදු සහ ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් සම්බන්ධයෙන් යෙදෙන්නාක් මෙන් ද ප්‍රධාන පනතේ 118වන වගන්තිය, 119වන වගන්තිය හා 120වන වගන්තිය පිළිබඳ සඳහන් කිරීම් මේ පනතෙහි 35වන හා 36වන වගන්ති පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

සේවකයන්ගේ පාරිශ්‍රමිකවලින් සේවායෝජකයන් විසින් කරනු ලබන අඩු කිරීම් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

58. (1) කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ක්‍රියා කරමින් සේවායෝජකයකු විසින් යම් සේවකයෙකුගේ 1972 අප්‍රේල් මස පළමුවන දිනයෙහි හෝ ඉන් පසු ආරම්භ වන යම් මාසයක් සඳහා වූ පාරිශ්‍රමිකයෙහි යම් මුදලක් අඩු කරනු ලැබූ අවස්ථාවක එම සේවායෝජකයා විසින්—

(අ) මේ පනත ආරම්භ වීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත එම මුදල කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය; එසේම

(ආ) එම මුදලේ ප්‍රමාණය සහ එම මුදල අඩු කරන ලද්දේ කිනම් මාසයක් වෙනුවෙන් ද යන වග නිශ්චිතව සඳහන් සහතිකයක් එම සේවකයාට නිකුත් කළ යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ක්‍රියා කරමින් සේවායෝජකයකු විසින් සේවකයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් මුදලක් අඩු කරනු ලැබූ අවස්ථාවක ඒ මුදල වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ විට මේ පනත යටතේ තමා විසින් ගෙවිය යුතු දායක මුදලින් එම මුදල හිලව් කරවා ගැනීමේ හිමිකම එම සේවකයාට තිබිය යුතු ය.

අර්ථ නිරූපණය.

59. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"කොමසාරිස්වරයා" යන්නෙන් ප්‍රධාන පනත යටතේ පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර ප්‍රධාන පනත යටතේ පත්කරනු ලැබූ හා කොමසාරිස්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා ක්‍රියා කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ අතිරේක දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් ද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් ද නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයකු හා සහකාර දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් ද එයට ඇතුළත් වෙති;

"තක්සේරුකරු" යන්නෙන් ප්‍රධාන පනත යටතේ පත් කරනු ලැබූ දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර එම පනත යටතේ පත් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් තක්සේරුකරුවකු හා සහකාර දේශීය ආදායම් තක්සේරුකරුවෙක් ද එයට ඇතුළත් වෙති;

"තක්සේරු කළ හැකි ආදායම" යන්නට ප්‍රධාන පනතේ 129 වන වගන්තියෙහි එම යෙදුමට දී ඇති අර්ථය විය යුතු ය;

"තක්සේරු වර්ෂය" යන්නෙන් යම් වර්ෂයක අප්‍රේල් මස පළමු වන දිනයෙන් ආරම්භ වන මාස දොළහක කාලපරිච්ඡේදය අදහස් වේ;

"තක්සේරු වර්ෂයකට පෙරාතුවම වූ අවුරුද්ද" යන්නෙන් ඒ තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ මාර්තු මස තිස්එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය අදහස් වේ;

"තැනැත්තා" යන්නට යම් නො බෙදුණු හින්දු පවුලක්, යම් බූදල් බලකරුවකු හෝ භාරකරුවෙක් හෝ නිශ්චිතව සඳහන් යම් සමාගමක් ඇතුළත් වේ;

"දරුවා" යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියේ එම යෙදුමට දී ඇති අර්ථය විය යුතුය;

"දායක මුදල" යන්නෙන් සාමාන්‍ය දායක මුදලක් හෝ විශේෂ දායක මුදලක් හෝ නිශ්චිතව සඳහන් සමාගමක් විසින් එයි විශේෂ ආදායම වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදලක් අදහස් වේ;

"නිර්වාසික" යන්නෙන් ප්‍රධාන පනතේ 54වන වගන්තියේ අර්ථානුකූලව, ශ්‍රී ලංකාවේ නේවාසික නොවූ බව අදහස් වේ;

"නිශ්චිතව සඳහන් සමාගම" යන්නෙන් විශේෂ ආදායම් ලබන සමාගමක් අදහස් වේ;

"නේවාසික" යන්නෙන් ප්‍රධාන පනතේ 54වන වගන්තියේ අර්ථානුකූලව, ශ්‍රී ලංකාවේ නේවාසික බව අදහස් වේ;

"පවුල" යන්නෙන් 3වන වගන්තියෙහි අර්ථානුකූල වූ පවුලක් අදහස් වේ;

"පුණ්‍ය කාර්යය" යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියේ එම යෙදුමට දී ඇති අර්ථය විය යුතු ය;

"ප්‍රධාන පනත" යන්නෙන් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදහස් වේ;

"ප්‍රධානයා" යන්න පවුලක් සම්බන්ධයෙන් යෙදෙන විට 3වන වගන්තියේ අර්ථානුකූල වූ එම පවුලේ ප්‍රධානයා අදහස් වේ;

"ප්‍රාග්ධන ලාභ" යන්නට ප්‍රධාන පනතේ 3වන වගන්තියේ "ප්‍රාග්ධන ලාභ" යන යෙදුමට දී ඇති අර්ථය විය යුතු ය;

"බදු අය කළ හැකි ආදායම" යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියෙහි "අයබදු අය කළ හැකි ආදායම" යන්නට දී ඇති අර්ථයම විය යුතු ය;

"බලය ලත් නියෝජිතයා" යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියෙහි එම යෙදුමට දී ඇති අර්ථය විය යුතු ය;

"බූදල් බලකරු" යන්නෙන් මිය ගිය තැනැත්තකුගේ බූදල් බලකරු හෝ බූදල් පරිපාලක අදහස් වන අතර—

(අ) මිය ගිය තැනැත්තකුගේ දේපළෙහි සන්තකය ලබා ගන්නා හෝ ඒ දේපළ සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත් වන යම් තැනැත්තකු;

(ආ) මිය ගිය තැනැත්තකුගේ බූදලය පිළිබඳ අන්තිම කැමති බලපත්‍රය හෝ බූදල් පරිපාලන බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයකට ඉල්ලුම් කළ හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු; හෝ

(ඇ) භාරයේ කර්තෘගේ අන්තිම කැමැත්ත අනුව පිහිටුවනු ලැබූ භාරයක් යටතේ ක්‍රියා කරන භාරකරුවෙක්

එයට ඇතුළත් වේ ;

" භාරකරු " යන්නට යම් මුදල් බලකරුවෙක්, භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය ගෙන යන යම් තැනැත්තෙක් ඇතුළත් වේ ;

" භාර්යාව " යන්නට නිසි බලය ඇති අධිකරණයක තීන්දු ප්‍රකාශයක් යටතේ හෝ යථා පරිදි ලියා අත්සන් කරනු ලැබූ වෙන්වීමේ ඔප්පුවක් අනුව හෝ සිය ස්වාමිපුරුෂයාගෙන් වෙන්ව ජීවත් වන හෝ වෙන්වීම ස්ථිර විය හැකි තත්ත්වයක් යටතේ සවාමිපුරුෂයාගෙන් ඇත්ත වශයෙන් ම වෙන්ව සිටින භාර්යාවක් ඇතුළත් නොවේ ;

" යැපෙන නෑයා " යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියේ එම යෙදුමට දී ඇති අර්ථය ම විය යුතු ය ;

" විශේෂ ආදායම " යන්නට මේ පනතේ 9 (3) වන වගන්තියෙහි එයට දී ඇති අර්ථය විය යුතු ය ;

" නියුක්තියෙන් ලැබෙන ආදායම " යන්නට ප්‍රධාන පනතේ 129වන වගන්තියේ එයට දී ඇති අර්ථය විය යුතු ය ;

" සමාගම " යන්නෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් කිසි ස්ථානයක බලපවත්වන යම් නීතියක් යටතේ නීතිගත කරනු ලැබූ හෝ ලියා පදිංචි කරන ලද යම් සමාගමක් අදහස් වේ.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද, පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.